# දහම් ගුරු ප්‍රථම විභාගය - 2018

## I පත්‍රය

## ප්‍රශ්න හා පිළිතුරු

**පළමුවන ප්‍රශ්නයට හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න**

---

**1.** i. පලස්තීනයට පිලිස්තිවරුන්ගේ රට යන අර්ථය භාවිතා කළේ කුමන ජාතිකයන් ද?
- ♦ රෝමරවරුන් ය.

ii. ඉශ්‍රායෙල් ජාතිකයන් සති මංගල්‍යය පැවැත්වූයේ කුමක් අරභයා ද?
- ♦ තිරුඟු අස්වැන්න කපා සති හතක් ගියපසු 50 වන මංගල්‍යය සිදු කිරීම.

iii. පුරාණ ගිවිසුම කතෝලික බෙදීම අනුව බෙදා ඇති ප්‍රධාන කොටස් මොනවා ද?
- ♦ නීති පොත්, ඉතිහාස පොත්, දිවැසි පොත්, ප්‍රඥා පොත්

iv. ශුද්ධ වූ පාවුලු තුමා රෝම ලිපිය ලියුවේ කුමන අරමුණකින් ද?
- ♦ ජුදෙව් හා අන්‍යජාතික ක්‍රිස්තියානි අතර ප්‍රශ්න පැණ නැගුන නිසා ජුදෙව් ආගම ක්‍රිස්තියානි ආගමට සම්බන්ධ බව පෙන්වීමට රෝම ලිපිය ලියා ඇත.

v. “ශුද්ධ වූ ලියවිලි තුළ ස්වර්ගික පියාණන් වහන්සේ තම දරුවන් හමු වී ඉමහත් ආදරයකින් යුක්ත ව ඔවුන් සමග සංවාදයේ යෙදෙන සේක” මෙම ප්‍රකාශනය අඩංගු වී ඇත්තේ කුමන ප්‍රකාශනයේ ද?
- ♦ දෙවන වතිකාන කතිකාවත නිකුත් කළ දේව ප්‍රකාශනය පිළිබඳ ප්‍රකාශනය.

vi. එඬේරික දේවානුභාවය යනු කුමක් ද?එඬේරික දේවානුභාවය යනු කුමක් ද?
- ♦ ක්‍රියාකාරි වීම සඳහා ලැබෙන දේවානුභාවය වේ. පූජකයන් හා නායකයන් මෙහෙයවන ලදී.

vii. ශු. බයිබලය අරභයා ශු. ජෙරෝම් තුමා කළ කාර්යය කුමක් ද?
- ♦ ශු. බයිබලය ප්‍රථම වතාවට ලතින් භාෂාවට පරිවර්තනය කිරීම.

viii. පැරණි ගිවිසුමේ සම්මත පොත් වශයෙන් ග්‍රන්ථ 46 ක් ඇති බව ප්‍රකාශ කළේ කුමන මන්ත්‍රණ සභාවෙන් ද?
- ♦ ට්‍රෙන්ට් මන්ත්‍රණ සභාව (ත්‍රිදෙන්තීනු මන්තණ සභාව)

ix. සෙප්ටුවාජින්ත පිටපත අනුසාරයෙන් ශුද්ධ වූ බයිබලයට ඇතුළත් වී ඇති ග්‍රන්ථ හඳුන්වන්නේ කුමන නමකින් ද?
- ♦ ද්විතීය සම්මත ග්‍රන්ථ

x. ශුද්ධ වූ ලියවිල්ලට බයිබලය යන වචනය භාවිතා කිරීම ආරම්භ කළේ කුමන ශුද්ධවරයා ද?
- ♦ සාන්ත ක්ලෙමන්ට් තුමා ය.

xi. දිව්‍ය පූජා යාගය තුළ දී සාන්තුවරයන් ව අප සිහිපත් කරන්නේ කුමක් අරභයා ද?
- ♦ එම ශුද්ධවරයන්ට දෙවිඳුන්ගෙන් ලැබුණු වරප්‍රසාදවලට තුති දීමට හා සාන්තුවරයන්ගේ සමෝස ධර්මලාභය තුළ එතුමන්ලාගේ පිහිට අපට ලැබෙන බව සිහිපත් කිරීමට ය.

xii. ජනවන්දනාවේ කේන්ද්‍රස්ථානය පාස්කු අභිරහස වේ. මෙය පහදන්න.

- ♦ පාස්කු අභිරහස තුළින් ක්‍රිස්තුන් වහන්සේගේ දුක් විඳීම මරණය හා උත්ථානය සිහිපත් කෙරේ. පාස්කු අභිරහස ජනවන්දනා කේන්ද්‍රස්ථානය වේ.

xiii. ආගමන සමය කිතුනුවන්ට වැදගත්වීමට බලපාන හේතු **දෙකක්** ලියන්න.

- ♦ සමිඳුන්ගේ මාංශගත වීමත්, එතුමන්ගේ ආගමනය සිදුවන ආකාරයත් පිළිබඳව විමසා බලන කාල සීමාවකි.
- ♦ මෙම සමය බලාපොරොත්තුවේ සමයකි.
- ♦ සමිඳාණන්ගේ ආගමනය සඳහා සැබෑ ජීවිත පෙරළියක් අත් දකින්නට අපට ආයාචනා කෙරේ.

xiv. ගොබ් ඉරුදින සිහිපත් කරන විශේෂිත දෑ **දෙකක්** ලියන්න.

- ♦ ගොබ් අතු ආසිරි ගැන්වීම.
- ♦ ජේසුස් වහන්සේ ජයොත්ස්වයෙන් ජෙරුසලෙම් නුවරට ඇතුළුවීමේ සිද්ධිය සිහි ගන්වයි.
- ♦ ශුද්ධවූ සතියේ ආම්භය ගොබ් ඉරිදා වෙ.

xv. කිතුනු ජනවන්දනාව යනු කුමක් ද?

- ♦ ජනවන්දනාව නම් ක්‍රිස්තුන් වහන්සේගේ හිස වන්නාවූ ද සියලු ම විශ්වාසිකයන් අවයව වන්නාවූ ද අති ඉන්ද්‍රීය දේහය විසින් පුද කරන එමගින් මනුෂ්‍යයන් ශුද්ධවත් කරන දේව ජනතාව ශුද්ධ වූ සභාවේ ක්‍රියාකාරිත්වයට යොමු කරන අග්‍රස්ථානය ද, ශුද්ධවූ සභාවට මුළු ශක්තිය ගලා එන්නට සලසන උල්පත ද වන්නේ ය.

xvi. තම පදවියේ පූජක සංඝය සමග රදගුරුතුමාගේ සුහදතාවය හා ඒකත්වය සංකේතවත් කරන්නේ කුමන මෙහෙය තුළින් ද?

- ♦ ශුද්ධවූ සතියේ දිනෙක පවත්වන තෛලාශිර්වාදික පූජා මෙහෙය තුළ දී (CHRISM MASS )

xvii. ආනන්ද අභිරහස් විශේෂයෙන් භාවිතා කිරීමට නියම වී ඇති ජනවන්දනා කාලය (සමය) කුමක් ද?

- ♦ ආගමන සමය

xviii. නමෝ මරිය යාච්ඤාවට පසුබිම් වී ඇති සුවිශේෂ ග්‍රන්ථය කුමක් ද?

- ♦ ශුද්ධවූ ලූක් සුබඅස්න

xix. වැන්දඹුව සහ විනිශ්චයකාරයාගේ උපමාවෙන් දෙන පණිවුඩය කුමක් ද?

- ♦ අධෛර්ය නොවී නොකඩවා යාච්ඤා කිරිමේ අවශ්‍යතාවය පෙන්වීම.

xx. ජේසුස් වහන්සේ යාච්ඤා කිරීමේ දි දුන් ආදර්ශ **දෙකක්** ලියන්න.

- ♦ නිරාහාරව යාච්ඤා කිරීම. ♦ හිරු උදාවට පෙර යාච්ඤා කිරීම.
- ♦ පියාණන් වහන්සේගේ කැමැත්තට එකඟව යාච්ඤා කිරීම.
- ♦ නොකඩවා යාච්ඤා කිරීම. ♦ සුදතුම් වරම් ඉල්ලා යාච්ඤා කිරීම.

2. i   යාච්ඤාවේ ගුණාංග **පහක්** ශුද්ධවූ බයිබලයෙන් උදහරණ ගෙන පෙන්වන්න.

- ♦ විශ්වාසය
- ♦ බැහැපත්කම
- ♦ අධෛර්ය නොවී නොකඩවා යාච්ඤා කිරීම.
- ♦ ප්‍රේමය, ආදරය, සමාව දීම
- ♦ පූර්ණ අවධානය, සාවධාන ව යාච්ඤා කිරීම.
- ♦ පියාණන්ගේ කැමැත්තට එකඟ ව යාච්ඤා කිරීම.
- ♦ සැබෑ යාච්ඤාවට ආදර්ශයක් - ස්වර්ගයේ වැඩ සිටින යැදුම.

ii   තුන්කාල ආරාධනාව යාච්ඤාව ලියා එහි ඇති පණිවුඩ **පහක්** ලියන්න.

♦ ස්වාමින්ගේ දූතයා මරියතුමියට සැල කළේ ය  - එවිට ස්ප්‍රිතු සාන්තු විසින් ගර්භනීය වුණා ය.

(නමෝ මරිය......)

මේ මම ස්වාමින් වහන්සේගේ දාසිය වෙමි - නුඹ කී වචනය ලෙස මට සිදුවේවා.

(නමෝ මරිය......)

වචනය තෙම ද මාංශ වුණේ ය - අප සමග ද වාසය කළේ ය.

(නමෝ මරිය......)

යාච්ඤා කරම් හ.

ස්වාමිනි සුරදූතයා සැළ කළ වචනයෙන් ඔබගේ පුත්‍ර වූ ක්‍රිස්තු තුමන්ගේ දුක් ප්‍රාප්තිය හා කුරුසිය උදෙසා මොක්ෂ ප්‍රතාප මහිමතාවයෙන් මාංශොත්ථානය ලබන ලෙස අපගේ ආත්ම ඔබගේ කරුණා ප්‍රසාදයට හේතු යුක්ත කොට ගෙන වදාළ මැනව. මේ කිදේ අපේ ස්වාමි වූ ජේසුස් ක්‍රිස්තු උදෙසාම ලැබේවා ආමෙන්.

- ♦ ජේසුස් වහන්සේගේ මාංශගතවීමේ අභිරහස නැවත නැවත සිහි ගැන්වීම.
- ♦ දේව මාතාවන්ගේ ගැඹුරු දේව විශ්වාසය
- ♦ දේව දූතයන්ගේ ක්‍රියා කලාපය ගැන දිස්වීම.
- ♦ දේව මාතාවන්ගේ නිහතමානි ජීවිතය ගැන මෙනෙහි කිරීම.
- ♦ දෙවිඳුන්ගේ පොරොන්දුව ගැන විශ්වාසය
- ♦ අප වෙනුවෙන් දේව මැණියන්ගේ මැදහත්භාවය පෙන්වීම.

3. i   යාච්ඤාව කිතුනු දිවියට වැදගත්වීමට හේතු **පහක්** ලියන්න.

- ♦ යාච්ඤාව තුළින් දෙවිඳුන් පැසසීම තුතිදීම, නමැදීම ඉල්ලීම, අවශ්‍යතාවයන් ලබා ගැනීම.
- ♦ අන් අය වෙනුවෙන් මැදහත්වීම
- ♦ දෙවිඳුන් හමුවේ තමන්ව හඳුනා ගැනීම හා ගැඹුරු සබැඳියාවකට පැමිණීම.
- ♦ දෙව් මිනිස් සබඳතාවය තහවුරු කිරීම.
- ♦ දෙවිඳුන්ගේ ආදරය හඳුනා ගැනීම.

ii   පහත සඳහන් අවස්ථාවල දී උච්චාරණය කළ හැකි කෙටි යාච්ඤාවන් නිර්මාණය කරන්න.

- ♦ දහම් ගුරුවන්ගේ රැස්වීමක් ආරම්භ කිරීමේ දී,
- ♦ නව දෙව්මැදුරක් ආසිරි ගන්වන අවස්ථාවක දී

(තේමාවට අනුව යාච්ඤා ලියන්න.)

4. i ක්‍රිස්තුන් වහන්සේගේ කාලයේ දී ඉශ්රායෙල් ජනතාවගේ දේශපාලන පසුබිම පිළිබඳව සැකෙවින් පැහැදිලි කරන්න.


මේ කාලය වන විට පලස්තීනය පුරා පැවති දේශපාලන ආගමික පසුතලය ගැන සෙවිය යුතු ය. එකල පලස්තීනය පුරා ග්‍රීක සංස්කෘතිය ඉතා හොඳින් පැතිර තිබුණි. පලස්තීනය පාලනය කළේ රෝම අධිරාජයා විසිනි. රෝම අධිරාජයා විසින් පත් කළ ආණ්ඩුකාරවරරු විසින් ජුදයාව, සමරියාව, ගලලිය පාලනය කරන ලදි. ඔවුන් යුව රජවරු වශයෙන් ද නම් කළහ. දේශපාලන පසුතලය ගොඩනැගී තිබුණේ ග්‍රීක දේශපාලන පසුබිම මත ය.

ඊජිප්තුවේ හා ඇලෙක්සැන්ඩ්‍රියාවේ සිටි ජුදා ජනතාව ග්‍රීක බස තම මව් බස බවට පරිවර්තනය කර ගත් හ. ජුදෙව් ශ්‍රේෂ්ඨාධිකරණය වූ මන්ත්‍රණ සභාව සැන්හෙඩ්‍රින් නමින් හැඳින්වීය. මේ සභාව පහත සඳහන් අයගෙන් සමන්විත ය.

- පූජක පේරුව හෙවත් පවුල් 24ට අයත් මූලික පූජකවරු (1 වංශවලිය 2)
- වයසින් මුහුකුරා ගිය අත්දැකීම් ඇති ප්‍රජා මූලිකයන් (මාක් 11:27)
- විනයධරයින් හෙවත් ජුදෙව් ව්‍යවස්ථාව පිළිබඳ අටුවාචාරින්

ජුදෙව් ජනතාවගේ සියලුම අධිකරණ බලතල සැන්හෙඩ්‍රින් සභාවට පවරා තිබුණි. රැස්වීම් පැවැත්වූයේ දේව මාලිගාවේ දි ය. දේශපාලනික වශයෙන් රෝම අධිරාජ්‍යයට බදු ගෙවන ලදී. ඒවා රැස්කළේ අයකැමියන් යයි නම් ලත් පිරිසකි. පවත්නා දේශපාලන ක්‍රමයට ලැදි පිරිසක් ද, ඊට විරුද්ධ පිරිසක් ද ජුදා සමාජයේ බිහි විය. සෙලොට්වරු හා සිතාරිවරු විප්ලවය තුළින් නිදහස පැතුහ. පරිසිවරු ග්‍රීක-රෝම සංස්කෘතික බලපෑම් පිළිකෙව් කළහ. සද්දුසිවරු ග්‍රීක-රෝම සංස්කෘතිය පිළිගනිමින් කාලානුරූපි වූහ.

ii 'ශුද්ධ වූ දේශයේ සිතියමක් ඇඳ පහත සඳහන් ස්ථාන එහි ලකුණු කර එම ස්ථානවලට අදාළ සිදුවීම බැගින් ලියන්න.




♦ කපර්ණාවුම් නුවර - ශතාධිපතියාගේ සේවකයාට සුවය, දුෂ්ටආත්ම ආවේශ වූ මිනිසා ව සුව කිරීම.

- ♦ නායින් නුවර - වැන්දඹු ස්ත්‍රියගේ පුත්‍රයා මළවුන්ගෙන් නැගිටුවීම.
- ♦ ජෙරිකෝව - අන්ධයා සුව කිරීම, ජෙරිකෝව මැදින් ගිය ගමනේ දී සාකේවුස් හමුවීම. යහපත් සමරතානුවරයාගේ කථාවේ ජෙරිකෝව ගම ගැන සඳහන් වේ.
- ♦ එම්මාවුස් - ගෝලයන් දෙදෙනාට උත්ථානවූ සමිඳුන් දර්ශනය වීම.
- ♦ බෙතානිය - මාර්තා සහ මරියාගේ ගම, ලාසරස්ව මරණයෙන් උත්ථාන කිරීම.

5. i දිවැසිවරුන්ගේ ප්‍රධාන ඉගැන්වීම් **පහක්** ලියන්න.

- ♦ ඒක දේව වාදය
- ♦ ස්වාමින් වහන්සේගේ දවස
- ♦ යුක්තිගරුක බව
- ♦ මෙසියානු සංකල්පය
- ♦ සමාජ සාධාරණත්වය
- ♦ ගිවිසුම් සංකල්පය
- ♦ සමාජ සාධාරණත්වය
- ♦ දුක් විඳින සේවකයා

ii ප්‍රසාද ස්නාපනය තුළින් ඔබ ලබන්නා වූ දිවැසිවර කැඳවීම මීසම තුළ ක්‍රියාත්මක කළ හැකි අයුරු පැහැදිලි කරන්න. (වචන 100 කින් පමණ)

- ♦ ප්‍රසාද ස්නාපනය තුළින් ලැබෙන පූජක, දිවැසිවර, රාජකීය යන ත්‍රිවිධ කැඳවීම ක්‍රියාවට නැංවීම.
- ♦ ක්‍රිස්තු දහම අන් අයට කියාදීම.
- ♦ දහමට සාක්ෂි දැරීම.
- ♦ පොදු ජනවන්දනාවට සහභාගි වීම.
- ♦ පියතුමන්ට ජනවන්දනාවට සහාය වීම.
- ♦ මීසම තුළ ආගමික හා සමාජීය සංවිධානයන්ට බැඳී සේවය කිරීම.
- ♦ ළමා, තරුණ, වැඩිහිටි ධර්මෝපදේශ සේවා ක්‍රියාත්මක කිරීම.
- ♦ මානව වටිනාකම් ගොඩනගන සංවිධාන තුළින් ප්‍රකාශ කිරීම.
- ♦ පවුල තුළ ක්‍රිස්තුන් වහන්සේට සාක්ෂි දැරීම.

6. i ශුද්ධ වූ බයිබලය දේවානුභාවයෙන් ලියා ඇති බවට සනාථ කිරීමට සාක්ෂි **පහක්** ඉදිරිපත් කරන්න.

- ♦ ක්‍රි.ව. 1893 දි දහතුන්වන ලියෝ පාප් වහන්සේ ප්‍රොවිඩෙන්ට්සේයිමුස් ඩේයුස් (PROVINDENTISSIMUS DEUS) විශ්ව ලේඛනය මගින් ශු. බයිබලය දේවානුභාවයෙන් ලියා ඇති බව සඳහන් වේ.
- ♦ ක්‍රි.ව.1920 මාර්තු 15 දින පහළොස්වන බෙනඩික් පාප්තුමා ලියූ ස්පිරිටුස් පරාක්ලිටුස් (SPIRTUS PARACLITDEUS) නම් ලේඛනයේ ශු. බයිබලය දේවානුභාවයෙන් ලියා ඇති බව සඳහන් වේ.
- ♦ ක්‍රි.ව. 1943 සැත්තැම්බර් 30 දින දොළොස්වන පියුස් පාප්තුමා ඩිවයිනෝ ඇෆ්ලාන්ටේ ස්ප්‍රිතු (DIVINO AFFLANTE SPIRTU)ප්‍රකාශනයේ ද ශු. බයිබලය දේවානුභාවයෙන් ලියා ඇති බව සඳහන් වේ.
- ♦ දෙවන වතිකාන කතිකාවත නිකුත් කළ දේව ප්‍රකාශනය නමැති ලේඛනයේ ද ශු. බයිබලය දේවානුභාවයෙන් ලියා ඇති බව සඳහන් වේ.
- ♦ ශුද්ධ වූ බයිබලයේ ද ඒ බව සනාථ කරන සාක්ෂි ද ඇත. 2 තිමොති හසුනේ සඳහන් ලෙස ''දේවානුභාවයෙන් යුත් මුළු ශු. ලියවිල්ල ඉගැන්වීමට ද, දුර්මත දුරු කිරිමට ද, හික්මවීමට ද, ධර්මිෂ්ඨ ජීවිතයක් ගත කිරීම පිණිස උපදෙස් දිමට ද ප්‍රයෝජනවත් වෙයි''(2 තිමෝති 3:16-17)

ii ධර්මෝපදේශය සඳහා ශුද්ධ වූ බයිබලය පදනම් කර ගත යුත්තේ ඇයි? (ප්‍රධාන කරුණු **පහක්** ලියන්න.

- ♦ ධර්මෝපදේශය දේව ප්‍රකාශනයෙන් පැන නගියි
- ♦ සැමවිට ධර්මෝපදේශය දීමේ දි ශු. බයිබලය කේන්ද්‍රය විය යුතු වේ.
- ♦ ධර්මය යනු ක්‍රිස්තුන් වහන්සේ ය. ක්‍රිස්තුන් වහන්සේගේ සුබ අස්න ශු. ලියවිල්ල තුළින් විද්‍යාමාන වේ.
- ♦ ධර්මෝපදේශයට අදාළ විෂය ක්ෂේත්‍ර නිතර ගනු ලබන්නේ ජීවමාන මූලාශ්‍රය වන දේව වචනය තුළිනි. දෙවිඳුන්ගේ අනාවරණය ශු. ලියවිල්ල තුළ ඇත.
- ♦ දේව වචනයෙන් තොර ධර්මෝපදේශය දීම නිශ්ඵල කාර්යයකි.

7. i දිව්‍ය පූජාව ක්‍රිස්තු ජීවිතයේ කේන්ද්‍රය යි. මෙය සනාථ කිරීමට කරුණු **පහක්** ලියන්න.

- ♦ ජනවන්දනාවේ උතුම් මෙහෙය දිව්‍ය පූජාව ය.
- ♦ ක්‍රිස්තුන් වහන්සේගේ දුක්විඳීම, මරණය, උත්ථානය නැවත සිහිපත් කිරීම.
- ♦ පිය දෙවිඳුන්ගේ උත්තරිතර ප්‍රේමය දිව්‍ය පූජාව වේ.
- ♦ දිව්‍ය පූජාවේ අනුහස, බලය, ශක්තිය තුළින් කිතු දහම ක්‍රිස්තුන් වහන්සේ තුළ නව ජීවනයක් ලැබීම.
- ♦ මිනිසා මිනිසා අතරත් දෙවිඳුන් අතරත් ප්‍රේමයෙන් එකට එක්වන්නේ දිව්‍ය යාගය තුළිණි.
- ♦ ශුද්ධවූ ත්‍රිත්වය තුළ ගැලවීමේ අභිරහස ලොව තුළ ජීවමාන කිරිම දිව්‍ය පූජාව තුළ සිදුවේ.
- ♦ විශ්ව සබඳතාවය තහවුරු කෙරෙන උත්තරීතර සංකේතය, යාගික භෝජනය, සහෝදරත්වයේ එකමුතුකමේ, තුති දීමේ යාච්ඤාවකි.

**ii** ශුද්ධ වූ සතිය අර්ථවත් කිරිමට ඔබට කළ හැකි ක්‍රියාකාරකම් **පහක්** විස්තර කරන්න.

- ♦ ශුද්ධ වූ සතියේ සෑම මෙහෙයකට ම සහභාගිවීම.
- ♦ සමගි සන්ධානයේ දේව ප්‍රසාද නිධානය ලැබ සූදානම් වීම.
- ♦ ශුද්ධ වූ සතියට අදාළ දේව වාක්‍යය කොටස් හොඳින් කියවා සූදානම් වීම.
- ♦ එක්වරු ශීලය රැකීම.
- ♦ මර්දනා ක්‍රියාවල නිරතවීම.
- ♦ ශුද්ධවූ සතියට අදාළ ශු. පැය, පාදනමස්කාර දිව්‍ය සත්ප්‍රසාද වන්දනාවේ නිරතවීම.

8. පහත සඳහන් මාතෘකාවලින් **තුනක්** තෝරාගෙන කෙටි සටහන් ලියන්න.
(එකකට පේළි **පහක්** පමණ)

### i ජනවන්දනා වසරේ සාමාන්‍ය සමය

♦ මෙය කොටස් දෙකකි. නත්තල් සමයේ අවසාන දින සිට ගුරු අඟහරුවාදා දක්වා එක කොටසක් ද, පෙන්තකොස්ත දිනට පසු එන සඳුදා සිට ආගමනයේ පළමු වන ඉරු දිනයට පෙර සෙනසුරුදා දක්වා කාලය අනිත් කොටසට ද අයත් වේ. සාමාන්‍ය සමයට ඉරුදිනයන් 34 ක් වේ. සාමාන්‍ය සමය තුළ කිතුනු ජනතාව ජේසු සමිඳාණන් තුළ තමන්ට අත්වුණ ගැලවිම මෙනෙහි කරයි. ශුද්ධ වූ ත්‍රිත්වයේ මංගල්‍යය ද සත්ප්‍රසාද මංගල්‍යය ද ක්‍රිස්තු රජාණන්ගේ මංගල්‍යය ද මේ සමය තුළ පවත්වයි.

### ii දිව්‍ය පූජාවේ සුරදූත ගීය

ස්වර්ගයෙහි දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා. ඉරුදිනවලදී ද සමහර ප්‍රාණ පරිත්‍යාගි මංගල දිනවලදි දි ග්ලෝරියා ගායනා කෙරේ. එහෙත් සමහර කාලවලට විශේෂයෙන් චතාරික කාලයේ දී හා ආගමන කාලයේ දි එය භාවිතා නොකෙරේ. මෙම සුරදූත ගායනය ලූක් 2:14 පාදක කරගත් ප්‍රශංසා ගීතයකි.

### iii කුම්රාන් පිටපත්

ක්‍රි. ව. 1947 -1956 දක්වා කාලයේ මළ මුහුද අසල ගුහාවල තිබී සම්භවුණ පැරණි ලිපි ලේඛන රාශියකි. මේවා අතර සම්මත හෙබ්‍රෙව් බයිබලයේ අනෙකුත් සියලුම පොත් සුළු වශයෙන් හෝ දක්නට ඇත. තවද ද්විතිය සම්මත ග්‍රන්ථ අතරෙන් සලමොන්ගේ ප්‍රඥාව, ජුඩිත් හා මකබ්වරුන්ගේ පොත් දෙක ද එහි නොතිබුණි. මීට අමතරව ක්‍රි. ව. 135 -ක්‍රි. ව. 68 දක්වා පමණ කාලයේ එහි විසූ කුම්රාන්වරුන්ගේ හෙවත් එසිතවරුන්ගේ වෙනත් කෘතින් ද සොයා ගන්නා ලදී. එසිතවරු ජෙරුසලෙමේ පූජක පෙළපතට නැකම් කියන්නන් ලෙස ඔවුන්ගේ ලියකියවිලි වලින් පෙනීයයි. ජෙරුසලමේ දේව මන්දිරයේ වත් පිළිවෙත්වලට ඔවුන් සහභාගි නොවීම, ඔවුන්ගේ ලේඛන තුළ දකිය හැකි ජෙරුසලමේ පූජක පැලැන්තියේ දැඩි විවේචන, නංවන දේව මාලිගාවට ගොස් නව ක්‍රමයකට වත් පිළිවෙත් පැවැත්වීම යන මේ දේවල් විශේෂඥයන් තේරුම් කරන්නේ එසිතවරුන් පූජකවරුන් හා සම්බන්ධ කොටසක් සැටියට ය. ඔවුහු දැඩි මර්දන ක්‍රියාවලින් යුත් තාපස ජීවිත ගත කළ හ. මෙහි සම්භ වූ පිටපත් අතුරෙන් නික්මයාම ග්‍රන්ථ පිටපතේ කොටසක් ක්‍රි. පූ. 3 වන ශත වර්ෂයේ මුල් භාගයෙන් බව පිළිගැණේ. ඒවා හෙබ්‍රෙව් බයිබල් පිටපත් අතුරෙන් ඉතා පැරණි ඒවා ලෙස සැලකේ. මේ පිටපත් අඩුවශයෙන් මැසරෙටික් පිටපතට පඩා අවුරුදු 1000 පමණ පැරණි ය. ඒවා පලස්තින ලේඛන සම්ප්‍රදායට අයිති ය. මැසරෙටික් පිටපත හා සංසන්දනය කර බලන විට කුම්රාන් පිටපත්වල වෙනස්කම් දක්නට ඇත. එස්තර්ගේ පොත පිළිබඳව එහි හෝඩුවාවන් ප්‍රමාණවත් නැතිකමෙන් පෙනියන්නේ මෙය එසිතවරුන් විසින් ප්‍රතික්ෂේප කිරිම ද? එසේ විය හැක. පළමුවෙන් එස්තර්ගේ පොතේ ඉශ්රායෙල්වරුන්ගේ දෙවියන් වහන්සේගේ නම (යාවේ) නොතිබීමත්, එහි පුරිම් නමැති පසුකාලින විනෝදකාමිත්වයෙන් පිරි මංගල්‍යය ඉස්මතු කිරිමත් මෙසේ ප්‍රතික්ෂේප කරනු ලැබිමට හේතු වු බව පෙනියයි. මේ කරුණු වලින් පෙනියන්නේ සම්මත යයි ගැනුණ බයිබලිය පොත් පෙළක් ජුදා ජාතින් අතර නොතිබුණු බව ය. තව ද සම්මත පොත් හා කිසිසේත් සම්බන්ධ නැති ජුබිලිවරුන්ගේ පොත කුම්රාන් අති පූජනිය ලෙස සලකනු ලැබීම මේ කරුණ තව දුරටත් තහවුරු කරයි.

### iv පලස්තීන දේශය

පලස්තීනය යනු පිලිස්තිවරුන්ගේ රට යන අර්ථය යි. මේ නම භාවිත කළේ රෝමවරුන් ය. ජුදෙව්වරුන් කිසි දින මෙම නම භාවිත කළේ නැත. පිළිස්තිවරු හා ජුදෙව්වරු පරම සතුරන් බැවින් මෙම නම භාවිතා නොකළ හ. නමුත් දාවිත් ගෝලියාත් කථාව බයිබලියේ නිතර සඳහන් වේ. (උත්පත්ති 21: 34 නික්මයාම 13: 17, සාමුවෙල් 6:1, 27:7, 2 රාජා 8:2)

### v ශුද්ධ වූ ජොහන් සුබාරංචිය

මෙහි එක ම උපමාවක් සදහන් නැත. ඉතිහාසයේ මෙය ලියා ඇත්තේ 90-100 අතර කාලයේ දි විසූ ක්‍රිස්තියානි සභාවට යි. සංකේතය රාජාලියා ය. පරිද්ජේද 21 කි. ධර්මය අතින් ගැඹුරු සුවිශේෂයකි. වැදගත් ම සුවිශේෂයයි. මේ සුවිශේෂයේ පරමාර්ථය වනුයේ ක්‍රිස්තියානිකාරයන් තුළ ඇති විශ්වාසය තහවුරු කිරීම යි. ජේසුස් වහන්සේ ගැලවුම්කරුවා පමණක් නොව දේව පුත්‍රයා බව ද තහවුරු කරයි. ජොහන්තුමා ජේසුස් වහන්සේ ව ඉදිරිපත් කරන්නේ මුලසිට ම මළවුන්ගෙන් ජයගත් තැනැත්තා ලෙසට ය. මෙහි තේමාව නම් දෙවියන් වහන්සේ තම එක ම පුත්‍රයා ලොවට එවූ බවයි.

# දහම් ගුරු ප්‍රථම විභාගය - 2018

## II පත්‍රය

## ප්‍රශ්න හා පිළිතුරු

**පළමුවන ප්‍රශ්නයට හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න**

---

i. ජේසුස් වහන්සේ ධර්මය ඉගැන්වීමට භාවිතා කළ ක්‍රම **දෙකක්** ලියන්න.

- උපමා කතා
- ප්‍රාතිහාර්ය
- පුද්ගල සංවාද
- දේශනා
- ස්වභාවික පරිසරය තුළින්
- ජීවිත ආදර්ශය

ii. ධර්මෝපදේශ ක්ෂේත්‍රයේ ප්‍රධාන සාධක දෙකක් ලියන්න.

- ගුරුවරයා
- ශිෂ්‍යයා
- විෂය කරුණු
- ක්‍රමය

iii. ආගම පොතට වඩා වැදගත් වන්නේ ධර්මෝපදේශකයා ය. හේතු **දෙකක්** දෙන්න

- ධර්මය උගන්වන්නාගේ ජීවිත ආදර්ශය වැදගත් ය.
- උගන්වන දෙයට සාක්ෂි දැරීම.
- ධර්මෝපදේශකයාගේ දැනුම, බුද්ධිය, හැසිරීම
- ධර්මෝපදේශකයා හොඳ ම ශ්‍රව්‍ය දෘෂ්‍ය ආධාරය වේ.
- ධර්මෝපදේශකයාගේ ආධ්‍යාත්මික ජීවිතය.

iv. දෙවන වතිකාන මන්ත්‍රණ සභාවෙන් පසු ගිහිදූත සේවයේ සිදු වූ ප්‍රධාන වෙනස්කම් **දෙකක්** ලියන්න.

- ගිහියා සභාවේ දූත කාර්යයන් සඳහා පෙරට ඒම.
- ගිහියා සභාව තුළ ක්‍රියාකාරි පුද්ගලයකු වීම.
- ප්‍රසාද ස්නාපනයෙන් ලත් ත්‍රිවිධ කාර්යයන් ක්‍රියාවට නැංවීමට යොමු වීම.
- සභා දූත කාර්යයන්හි ගිහි අයගේ එකමුතුකම.
- ජනවන්දනාව තුළ ක්‍රියාකාරි ලෙස ගිහියා සහභාගි වීම.

v. සභාවේ 21වන ජගත් මන්ත්‍රණ සභාව කුමක් ද?

- දෙවන වතිකාන මන්ත්‍රණ සභාව

vi. දෙවන වතිකාන මන්ත්‍රණ සභාව මගින් පූජක හා පැවිදි දිවිය පිළිබඳ නිකුත් කළ නියෝග ව්‍යවස්ථා ලේඛන **දෙකක්** නම් ලියන්න.

- පැවිදි දිවිය කාලානුරූප කිරීම පිළිබඳ නියෝගය
- පූජක පුහුණුව පිළිබඳ නියෝගය
- පූජක ජීවිතය හා සේවාව පිළිබඳ නියෝගය

vii. ආබ්‍රහම් තුමාගේ නායකත්වයේ ගුණාංග **දෙකක්** ලියන්න.

- දෙවිඳුන් කෙරෙහි අචල විශ්වාසය.
- වගකීම් භාරගැනීම.
- නියමිත ඉලක්කයක් කරා ගමන් කිරීම.
- ගැටළු විසඳීමේ දී ප්‍රඥාගෝචර වීම.
- බාධා මැද ගමන් කිරීම.
- සැමවිට ම දේව කැමැත්ත විමසීම.

viii. කිතුනු නායකත්වයේ අරමුණ කුමක් ද?

- ♦ දෙවිඳුන් වෙත පූර්ණ විශ්වාසය
- ♦ අන් අය සමග දුක, සතුට බෙදා ගැනීම.
- ♦ නීතිගරුක වීම.
- ♦ පරිත්‍යාගීශිලි වීම.
- ♦ අන් අය පිළිගෙන සාමුහික ව කටයුතු කිරීම.
- ♦ ආරක්ෂාව සැලසීම.
- ♦ අන් අයට මග පෙන්වීම.

ix. දහම් ගුරුවරයෙකුට තම මීසම තුළ නායකත්වය ගත හැකි අවස්ථා **දෙකක්** ලියන්න.

- ♦ දහම් පාසල තුළ ඉගැන්වීම.
- ♦ ආගමික සමිති සමාගම්වලට බැඳී කටයුතු කිරීම.
- ♦ මූලික කිතුනු ඒකකවල නායකත්වය ගැනීම.
- ♦ අසීපා වැනි වැඩසටහන් මෙහෙයවීම.
- ♦ ජනවන්දනා මෙහෙයන්ට ආධාරවීම.
- ♦ මීසම් ධර්ම සේවා සභාවල සාමාජිකත්වය ලැබීම.

x. සාරධර්ම නිසා මිනිසා තුළ ඇතිවන යහපත් ගුණාංග **දෙකක්** ලියන්න.

- ♦ මිනිසා තුළ ඇතිවිය හැකි තිරිසන් ආවේග වලින් මිදීම.
- ♦ ධර්මානුකූල ව දිවි ගෙවීම.
- ♦ සත්‍යය සොයා යාම.
- ♦ විනීතවීම
- ♦ යහපත් හැඟීම් ඇතිකර ගැනීම.

xi. නායකයෙකු නායකත්වය ලබා ගන්නා මාර්ග **දෙකක්** ලියන්න.

- ♦ උපතින් ලබන නායකත්වය
- ♦ ස්වඋත්සාහයෙන් ලබන නායකත්වය
- ♦ බලහත්කාරයෙන් නායකත්වයට තල්ලුවන අය

xii. ප්‍රාථමික ශ්‍රේණිවලට ධර්මෝපදේශය ඉගැන්වීමේ ක්‍රම **දෙකක්** ලියන්න.

- ♦ කථාන්තර ක්‍රමය
- ♦ පින්තූරු ක්‍රමය
- ♦ ක්‍රියාකාරකම් ක්‍රමය
- ♦ සංවාද ක්‍රමය

xiii. ශුද්ධාත්මයාණන් නව පෙන්තකොස්තයක් මඟින් සභාවට උපත ලබා දුන් අයුරු විස්තර කරන ශුද්ධ වූ බයිබලයේ පොත කුමක් ද?

- ♦ අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොත

xiv. මුල් සභාවට ජනතාව 3000 එකතු වූ බව පෙන්වා දෙන්නේ කවරෙකුගේ දේශනයෙන් පසු ද?

- ♦ ශුද්ධ වූ පේදුරු තුමා

xv. මුල් සියවස්වල රෝම අධිරාජ්‍යයේ තිබූ අධ්‍යාපන පීඨ නිසා සිදු වූ සේවාවන් **දෙකක්** ලියන්න.

- ♦ එම අධ්‍යාපන පීඨවල බුද්ධිමත්, තරුණ පිරිස් අධ්‍යාපනය ලැබීම, ප්ලේටෝ, ඇරිස්ටෝටල්, සොක්‍රටීස් යන අයගේ දර්ශන හැදෑරීම,
- ♦ එම නිසා හෘදයේ සාක්ෂිය අනුව යහපත හා අයහපත තෝරාගැනීමේ චින්තන බලවේගයක් ඇතිවීම.
- ♦ ලොව තුළ ගවේෂකයන්, සොයා ගැනීම් වලට පිරිස් යොමුවීම.
- ♦ සාහිත්‍ය දියුණුවීම.

xvi. කිතු දහම රෝමානු කතෝලික යන නමින් හැඳින්වෙන්නේ කුමක් නිසා ද?

- ♦ කිතු දහමේ මූලස්ථානය රෝමයේ පිහිටා ඇති නිසා.

xvii. පේදුරු හා ජුවාම් සිරභාරයට ගෙන මරණීය තර්ජන එල්ල කළ පිරිස් කවුද?

- ♦ උත්තම පූජකවරු හා සදිසිවරු

xviii. මාර්සිලස් පාප්තුමා ප්‍රාණ පරිත්‍යාගී බවට පත්වූයේ කිනම් අධිරාජ්‍යයාගේ සමයේ ද?

- ♦ දියෝක්ලේෂියානු අගරජුගේ

xix. මෙතුමාණෝ හිප්පෝ නගරයේ රදගුරු තුමා විය. ව්‍යාක්ත කථිකයෙකි. ප්‍රධාන ලේඛකයෙකි. පඬිවරයෙකි. මෙතුමා කවුද?

- ♦ ශුද්ධ වූ අගොස්තීනු මුනිවතුමා

xx. කිතුනු තපස් ජීවිතයේ ගුණාංග **දෙකක්** ලියන්න.

- ♦ අල්ප හා සරල ජීවිතය ♦ ගැඹුරු යාච්ඤාවේ හා මර්දනාවේ ජීවිතය
- ♦ ජීවිත ආදර්ශය

2. i දෙවන වතිකාන කතිකාවත පැවැත්වීමේ මූලික පරමාර්ථයන් **පහක්** ලියන්න.

- ♦ පළමුවන වතිකාන කතිකාව ප්‍රංශ ප්‍රසියන් යුද්ධය නිසා දිගට ම කරගෙන යාමට නොහැකි විය. එබැවින් ඉතිරි වූ කෙටුම් පත්වල අඩංගු කරුණු මගින් සභාව නැවත ප්‍රාණවත් කිරීම 23 වන ජුවාම් පාප්තුමාගේ අදහස විය.
- ♦ පළමු ජගත් මන්ත්‍රණ සභාව විශේෂයෙන් ධර්ම සත්‍යයන් ආරක්ෂා කිරීම හා ධර්ම විරෝධීන් හා මිථ්‍යා ලබ්ධිකයන්ට විරුද්ධ විය. එහෙත් දෙවන වතිකාන කතිකාවෙන්, ධර්ම සත්‍යයන් ආරක්ෂා කිරීමට වඩා එඬේරික සේවයක් කිරීමේ අරමුණ ඉදිරිපත් විය. එනම් කතිකාවේ මූලික අරමුණ වූයේ මිනිසාගේ වැදගත් බව හා උතුම්කම පෙන්වීමය.
- ♦ පවුල හා සමාජ ජීවිතය ඇතුළු මානව ක්‍රියාකාරීත්වයේ සෑම මට්ටමකටම දහම ගෙන යාමේදී ශුද්ධ ලියවිල්ලට හා පළමු පියවරුන්ගෙන් උරුම වූ සත්‍යතා වෙත දැඩි අවධානය යොමු කිරීම.
- ♦ විශ්වාසයේ සත්‍යතාවන් වෙනස් වන ලෝකයට එනම් නූතන මිනිසාගේ මනෝභාවයට ගැලපෙන පරිදි දෙව් දහම තුළින් ඉදිරිපත් කිරීම.
- ♦ ලෝකය එක් දිසාවකට ගමන් කරද්දී, ඊට ඉඳුරා ම වෙනස් වූ මාර්ගයක සභාව ගමන් කළ බැවින් කාලාන්තරයක් වසා තිබූ සභාවේ දොර කවුළු විවෘත කර සභාව ලෝකය තුළ මාංශ ගත විය යුතු බව 23 වන ජුවාම් පාප්තුමාට වැටහීයාම.
- ♦ විවිධ ක්‍රිස්තියානි සභා අතර මේ තාක් එකිනෙකා කෙරෙහි තිබූ සැකය හා අවිශ්වාසය දුරුකර සභා එකමුතුවකට මග පාදා ගැනීම.

ii දෙවන වතිකාන කතිකාවෙන් පසු ජනවන්දනාවේ ඇති වූ නවෝදය යන මැයෙන් කිතුනු පුවත්පතකට ලිපියක් ලියන්න. (වචන 100 පමණ)

- ස්වභාෂාවලින් දිව්‍ය පූජාව පැවැත්වීම.
- ගිහි නායකත්වය වැඩි වීම.
- වත් පිළිවෙත් සරල වීම.
- දේව ප්‍රසාද නිධානවල සංශෝධනය (ජනතාවට වඩාත් සමීප කරන පිළිවෙත් ක්‍රියාත්මක කිරීම).
- ශුද්ධ බයිබලය කේන්ද්‍රීය කරගත් ජනවන්දනා සැලැස්මක් බිහිවීම.
- දේශීය සංස්කෘතික දෑ ජනවන්දනාවට එක්වීම.
  නීතිරීති ලිහිල් වීම. (උදා: දිව්‍ය සත්ප්‍රසාදය ලැබීමට පෙර ආහාර ගැනීමට තිබූ නිතීය පැයකට කලින් වීම.
- භක්ති අභ්‍යාසවලට වඩා දිව්‍ය යාගයේ වැදගත්කම හුවා දැක්වීම.
- ගිහි ජනතාව භක්ති අභ්‍යාසවල පෙරමුණ ගැනීම.

3. i ධර්මෝපදේශයේ අරමුණු **පහක්** ලියන්න. .

- පූර්ණ මානව ස්වියත්වයක් ගොඩ නැගීම දෙවියන් වහන්සේ වෙත මිනිසාගේ සිත හැරවීම.
- දේව වචනය දීමෙන් සැබෑ මනස්ථාපයක් ජනිත කිරීම.
- පූර්ණ ව ක්‍රිස්තු අභිරහස වෙත ඔහුව ගෙන යාම.
- පාස්කු අභිරහසට ප්‍රායෝගික ව සාක්ෂි දැරීමේ හැකියාව නැංවීම.
- මුළු දේව ජනතාවගේ විමුක්තිය සඳහා ක්‍රියා කළ හැකි පුද්ගලයන් බිහි කිරීම.
- ලෞකික පටිපාටිය තුළට සුවිශේෂ අගයයන් ඇතුළත් කර එය ශුද්ධවත් කිරීම.

ii දහම් පාසල් තුළ ගුරු, දෙගුරු, ශිෂ්‍ය යන ත්‍රිවිධ සම්බන්ධතාවය මනා ලෙස ශක්තිමත් වීම තුළ දහම් පාසල සාර්ථක වේ. මේ අදහස පැහැදිලි කරන්න.

- දරුවන්ගේ පළමු පාසල පවුල වේ. නිවස තුළ යහපත් ධාර්මික පැවැත්ම තුළ පවුල තුළ ආගමික වාතාවරණය දියුණු වේ.
- දහම් පාසල හා දෙමව්පිය සම්බන්ධය නිසි ලෙස ගොඩ නගා ගත යුතු ය. දහම් පාසල් දරුවන්ගේ දෙමව්පියන් දහම් ගුරුවරුන් හමුවී තම දරුවන්ගේ ආගමික වර්ධනය ගැන සොයා බැලිය යුතු ය.
- ගුරු, සිසු, දෙමව්පියන් අතර සම්බන්ධතාවය නිරතුරු ව ඇතිවීම තුළ අන්‍යෝන්‍ය අවබෝධය, එකමුතුකම, සහෝදරත්වය, වර්ධනය වීම.
- ගුරුවරයාට, තම සිසුවාව/සිසුවියව නිසි ලෙස අවබෝධ කර ගැනිමට දෙමව්පිය සහයෝගය බැඳීම අවශ්‍යය ය.
- දෙමව්පියන් ගුරුවරුන් හමුවී තම දරුවන් ගැන නිරතුරු විමසා බැලිම.

4. i මුල් සියවස් තුන තුළ රෝම අධිරාජ්‍යයෙන් ක්‍රිස්තියානින්ට පීඩා කිරීමට හේතු වූ කරුණු **පහක්** ලියන්න.

- ක්‍රිස්තියානිහූ රජයේ සේවය හා හමුදාවේ සේවය ප්‍රතික්ෂ්ප කිරීම.
- රෝම අධිරාජ්‍යයා ව දේවත්වයෙන් පිදීමටත්, ඔහුගේ නමින් දිවුරීමත් ප්‍රතික්ෂේප කිරීම.
- රෝම දෙවි දේවතාවන්ට මල් පහන් පුද නොකිරිම.
- ක්‍රිස්තියානින් අප්‍රසිද්ධියේ පවත්වන වත් පිළිවෙත්, සදාචාර විරෝධී බවත් ඔවුන් කුමන්ත්‍රණකාරී පිරිසක් බවත් ජුදා නායකයන් අධිරාජ්‍යයාට එත්තු ගැන්වීම.
- දේව රාජ්‍යය ගැන කථා කරන නිසා අධිරාජ්‍යා විසින් ක්‍රිස්තියානින්ට විරුද්ධ ව තහනම් නියෝග කීපයක් පනවන ලදී.

ii අද ශ්‍රී ලංකාව තුළ කිතුනුවන්ට මුහුණ පෑමට ඇති පීඩාවන් හමුවේ, කිතුනු ඔබගේ සාක්ෂි දැරීම පැහැදිලි කරන්න. (වචන 100 ක් පමණ)

- ♦ සත්‍ය ය ධර්මය පහදා දීම.
- ♦ සත්‍යයට සාක්ෂි දැරීම.
- ♦ අසත්‍යය දෑ නිවැරදි කිරීම.
- ♦ ජනමාධ්‍ය තුළින් සත්‍යය පහදා දීම.
- ♦ යාච්ඤාව, භාවනාව තුළ වර්ධනය.
- ♦ පොත් පත් ප්‍රකාශයට පත් කිරීම.(සත්‍ය පහදා දීම)
- ♦ ආගමික සමිති සමාගම් තුළින් හැඩ ගැස්ම.
- ♦ රාජ්‍ය මට්ටම දක්වා යමින් සත්‍යය නිවැරදි කිරීම.

5. i අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොතේ සඳහන් ලෙස පෙන්තකොස්ත මංගල්‍යය දින සිදු වූ සිද්ධිය විස්තර කරන්න.

- ♦ පෙන්තකෝස්ත දින ශ්‍රාවකයෝ සහ මරිය තුමිය එක් තැනෙක රැස් ව සිටින විට සැඩ සුළඟක් හමන්නාක් මෙන් හඬක් හදිසියෙන් පැමිණියේ ය. ඔවුන් සටි ගෙය මුළුමනින් ම එයින් පිරී ගියේය. ගිනි දළු වැනි දිව් බෙදී ගොස් ඔවුන් එකිනෙකාගේ හිස් මත පිහිටුවිය. සියල්ලන් ම ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ ව ආත්මයාණන් ඔවුන්ට දුන් කථා ශක්තිය අනුව අභ්‍යාසවලින් කථා කරන්නට විය.
- ♦ රැස්ව සිටි බොහෝ පිරිස්වලට තම තමන්ගේ භාෂාවලින් පැහැදිලි කරන්නට විය.
- ♦ අපෝස්තුළුවරු බිය සැක නැතිව ක්‍රිස්තු සුබාරංචිය දෙසන්නට විය.
- ♦ ක්‍රිස්තු උත්ථානයට සාක්ෂි දරන්නට විය.
- ♦ පේදුරුගේ මුල්ම දේශනයෙන් 3000 ක් පමණ සභාවට එක්විය. (ක්‍රියා 2 පරිච්ඡේදය)

ii අද සිරිලක දහම් සේවාව යොමු විය යුතු ක්ෂේත්‍ර **පහක්** ගැන විස්තර කරන්න.

- ♦ වැඩිහිටි ධර්මෝපදේශය
- ♦ තරුණ තරුණියන් හට
- ♦ අනාථ හා සරණාගත කඳවුරුවල සිටින අය වෙත
- ♦ ගොවි කම්කරු ජනතාව වෙත
- ♦ ළමා නිවාස
- ♦ විවිධ කර්මාන්ත පුරවරවල සේවකයනට
- ♦ කෘෂිකාර්මික ආයාතන
- ♦ සංක්‍රමික ධීවර ජනතාව වෙත

6. i දිවැසිවරුන්ගේ නායකත්වයෙන් අද ඔබ හට ගත හැකි ආදර්ශ **පහක්** ලියන්න.

- ♦ ඒක දේවවාදය තුළ දිවි ගෙවීම.
- ♦ මීසම තුළ නායකත්වය ගැනීම.
- ♦ ආදර්ශමත් ජීවිත රටාව.
- ♦ කැප වූ, වැය වූ පරිත්‍යාගීශිලී ජීවිත රටාව.
- ♦ එඩිතර වීම, අවංක වීම.
- ♦ චාම් සරල ජීවිත රටාව
- ♦ ගැඹුරු දේව විශ්වාසය

ii දහම් ගුරුවරයෙකු ලෙස පොදු ජන සමාජයේ දී ඔබට පැවරෙන වගකීම් **පහක්** ලියන්න.

- පොදු ජන සෙත උදෙසා වැය වීම.
- මානව අගයන් හීන ව පවත්නා සමාජය තුළ ඒවා කාවැද්දවීම.
- සැබෑ කිතුනු රටාවක් තුළ ජීවත්වීම (ජීවිත සාක්ෂිය)
- පොදු සමිති ප්‍රජා සේවාවල ක්‍රියාකාරී සේවය.
- කිතුනු ආකල්ප සමාජය තුළ ප්‍රගුණ කිරීමට වැයවීම.
- ආදර්ශමත් පවුල් ජීවිත

7. **i** දහම් ගුරුවරයෙකු සතු ගුරු පෞරුෂත්වයේ ගුණාංග **පහක්** ලියන්න.

- දහම් ගුරුවරයාගේ ජීවිත සාක්ෂිය යහපත් වීම.
- ඉගැන්වීමේ දක්ෂතාවය.
- සිසුන් තේරුම් ගැනීමේ හැකියාව.
- ආදරය, කරුණාව පෙරදැරි වීම
- ක්‍රියාශීලී කැප වූ ජීවිතය

**ii** දහම් ගුරුවරයා විසින් සිසුන්ව අවබෝධ කර ගැනීමට ගතයුතු පියවරවල් **පහක්** ලියන්න

- සිසුන්ගේ දෙමව්පියන් සමග සම්බන්ධතාවයන් ගොඩනගා ගැනීම.
- සිසුන් සමග සුහද සංවාදය
- වත් පිළිවෙත්වලට සිසුන් සහභාගී වීම නිරීක්ෂණය කිරීම.
- එක් එක් සිසුවා කෙරෙහි තබා ඇති පෞද්ගලික සටහන් වාර්තා
- කායික අවශ්‍යතාවයන් ලැබී ඇතිදැයි විමසිලිමත් වීම.
- පවුල පරිසරය තුළ දරුවාට ලැබිය යුතු මූලික මානසික අවශ්‍යතාවය හා ආදරය කරුණාව අගය කිරීම නිදහස ලැබේදැයි සොයා බැලීම.
- විවිධ පරීක්ෂණ ඇගයීම් හා ක්‍රියාකාරකම් තුළින් ශිෂ්‍යයාගේ බුද්ධිය හා මනස තේරුම් ගැනීම.

8. පහත සඳහන් මාතෘකාවලින් **තුනක්** තෝරාගෙන කෙටි සටහන් ලියන්න.
(එකකට පේළි **පහක්** පමණ)

**i හයවෙනි පාවුලු පාප්තුමා**

1963 දී ශුද්ධාසනයට පත්විය. දෙවන වතිකාන කතිකාවත ඉදිරියට ගෙන ගියේ මෙතුමා ය. ප්‍රගතශීලි පාප්තුමෙකි. විශ්ව ලේඛන ගණනාවක් ලියා ඇත. වතිකානයෙන් පිට විදෙස් සංචාරයක් ආරම්භ කළේ මෙතුමා ය. අන් සභා හා අන්‍ය ආගම් අතර සුහද සංවාදයේ යෙදීමට මෙතුමා මූලික වූයේ ය. ශ්‍රී ලංකාවට මෙතුමා 1970 දි පැමිණියේ ය. 1978 දී ස්වර්ගස්ථ විය.

**ii ආගමික පුවත්පත් හා සඟරා**

ආගමික පුවත් පත් හා සඟරා තුළින් දහම ව්‍යාප්තියට උදව් කර ගත හැක. යම් ආගමික මාතෘකාවට අදාළ ලිපි පුවත්පත්වල හා ආගමික සඟරාවල පළ කිරීම තුළ එම ලිපි කියවන පාඨකයාට ද දැනුමක් ලබා ගත හැක. ආගමික ධර්මය ප්‍රචාරයට ආගමික පුවත් පත් සඟරා වැඩි වශයෙන් භාවිත කළ යුතු වේ.

**iii දහම් ගුරුවරයාගේ ජීවිත ආදර්ශය**

- දහම්ගුරුවරයා උගන්වන දේ පළමුව තම ජීවිතය තුළින් පෙන්වීම වඩාත් වැදගත් ය.
- උගන්වන දේ ගැන හොඳ අවබෝධයක් තිබිම.
- කැපවීම, වැයවීම, ක්‍රියාශිලි වීම, පරිත්‍යාගිශීලි වීම.
- ආදරය, කරුණාව, ඉවසීම යහපත්කම යන කිතුනු ගුණාංග පිළිබිඹුකර ඒ මගින් දරුවන් දෙවිඳුන් වෙතට යොමු කිරීම.
- තමාගේ ඉරියව් කථා විලාශය, පෙනුම යනාදියෙන් සිසුන් තුළ යහපත් ආකල්පයන් ඇති කිරීම.
- දහම් ගුරුවරයා නූතන දිවැසිවරයෙකි.

**iv මැක්ෂිමිලියානු අග රජුගේ පීඩනය**

ක්‍රි. ව. 235 - 238 අතර කාලයේ දීය. මෙහි දී මරණයට පත්වුණේ ඥාන ගේපාලයන් ය. පාප්තුමන්ලා වහළුන් මෙන් පතල්වලට යවන ලදී. මෙම කාලයේ දී පොන්ටේනියස් පාප්තුමන් ද, අන්ත පාප් කෙනෙකු ලෙස පත්වූ හිපොලිටස් ද මරුමුවට පත් කරන ලදි. කිතුනුවෝ බොහෝ දෙනෙක් මේ සමයේ දී ප්‍රාණපරිත්‍යාගි විය.

**v කැල්සිඩොන් හි පවත්වන ලද හතරවන ජගත් මන්ත්‍රණ සභාව**

එව්ටිකස් නමැති තාපසයා ක්‍රිස්තුන් වහන්සේ තුළ ඇත්තේ එක ස්වභාවයක් බව ඉගැන්වීය. මාෂියන් අධිරාජයා 450 - 457 මන්ත්‍රණ සභාවක් කැඳවා ලියෝ පාප්තුමා විසින් ඉදිරිපත් කරන ලද සත්‍ය ධර්මය පිළිගන්නට සැලැස්වී ය. එනම් ක්‍රිස්තුන් වහන්සේ එක පුද්ගලයෙක් වන නමුත් ස්වභාව දෙකක් ඇත්තේ ය. එනම් දේව ස්වභාවය හා මනුෂ්‍ය ස්වභාවය යි.